# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන සහ සේවා




## 2023 සැප්තැම්බර් මාසයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන ක්‍රියාකාරකම්වල පහත වැටීමක් ද සේවා ක්‍රියාකාරකම්වල ඉහළ යෑමක් ද පෙන්නුම් කරන ලදී.

**ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2023 සැප්තැම්බර් මාසයේදී දර්ශකාංක 45.7ක අගයක් වාර්තා කරමින් නිෂ්පාදන ක්‍රියාකාරකම්හි පහත වැටිමක් පිළිඹිබු කරන ලදී.** මේ සඳහා සියලුම උප-දර්ශකයන්ගේ පසුබැස්ම හේතු විය.

නව ඇණවුම් සහ නිෂ්පාදන පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශවල පසුබැස්ම හේතු විය. පාරිභෝගික ඉල්ලුම පහත වැටීම සහ ආනයනික භාණ්ඩ තරඟකාරී මිල ගණන් යටතේ ක්‍රමයෙන් වෙළඳපොලේ සුලබ වීම හේතුවෙන් ව්‍යාපාර කටයුතු අභියෝගාත්මක වී ඇති බව බොහෝ නිෂ්පාදකයින් සඳහන් කරන ලදී. තවද, ගෝලීය ඉල්ලුමෙහි පවතින පසුබැස්ම හේතුවෙන් රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශය අඛණ්ඩව පහත වැටුණි. එසේම, නව ඇණවුම් සහ නිෂ්පාදන පහත වැටීමට සමගාමීව සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් ද පහත වැටුණි. මේ අතර, පෙර මාසයට සාපේක්ෂව 2023 සැප්තැම්බර් මාසයේදී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අඩු විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 45.7**
**2023 සැප්තැම්බර්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචලයය | අගෝ. | සැප්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | 49.3 | 45.7 | - | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| **උප-දර්ශක** | | | | |
| නව ඇණවුම් | 53.0 | 43.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිෂ්පාදන | 48.0 | 44.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 43.5 | 47.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 50.0 | 47.0 | - | කඩඉම් මට්ටමේ සිට පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 51.0 | 49.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කෙසේ වෙතත්, එළඹෙන උත්සව සමයේ දී ඉල්ලුමෙහි අපේක්ෂිත ඉහළ යෑම හේතුවෙන්, ඉදිරි මාස තුන සඳහා නිෂ්පාදන කටයුතුවල අපේක්ෂා යහපත් මට්ටමක පවතියි.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.1කින් ඉහළ යමින් 2023 සැප්තැම්බර් මාසයේ දී 49.1ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

සිංගප්පූරුව සහ රුසියාව යන රටවල පසුගිය මාසයට සාපේක්ෂව 2023 සැප්තැම්බර් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වැඩි වේගයකින් ද චීනය, සහ ඉන්දියාව යන රටවල අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, සහ එක්සත් ජනපදය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව 2023 සැප්තැම්බර් මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 ඔක්තොම්බර් 13 වන දිනට*

[1] *එස්&පී ග්ලෝබල් (S&P Global) ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**54.7**

**2023 සැප්තැම්බර්**


**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 අගෝස්තු මාසයට සාපේක්ෂව සේවා ක්‍රියාකාරකම්හි අඩු වේගයක වර්ධනයක් පෙන්නුම් කරමින්, 2023 සැප්තැම්බර් මාසයේ දී දර්ශකාංක 54.7ක් වාර්තා කළේය.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ ඉහළ යෑම් හේතු විය. කෙසේ වුවද, 2023 සැප්තැම්බර් මාසය තුළ දී නිමකිරීමට නියමිත කාර්යයන් 2023 අගෝස්තු මාසයට සාපේක්ෂව පහළ යමින් අඩු අගයක පැවතුනි.

සේවා අංශයේ නව ව්‍යාපාර පිළිබඳව සලකා බැලීමේ දී, ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, තොග සහ සිල්ලර වෙළෙඳාම, දේපල වෙළෙඳාම, රක්ෂණ සහ අධ්‍යාපන යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, අගෝස්තු මාසයට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ දී නව ව්‍යාපාර ඉහළ ගියේය.

උප අංශ කිහිපයක ධනාත්මක වර්ධනයන් පෙන්නුම් කරමින්, සැප්තැම්බර් මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් ද ඉහළ ගියේය. ඒ අනුව, මූල්‍ය සේවා උප අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් තවදුරටත් වැඩිදියුණු වූ අතර, ඒ සඳහා ණය පොලී අනුපාත පහත වැටීමත් සමඟ ණය ඉල්ලුම ක්‍රමානුකූලව ඉහළ යෑම හේතු විය. තවද, අධ්‍යාපන සහ ප්‍රවාහන යන උප අංශවල යම් සාධනීය වර්ධනයන් සැප්තැම්බර් මාසය තුළ දක්නට ලැබිණි. මේ අතර, සැප්තැම්බර් මාසය තුළ සංචාරක පැමිණීම් සුළු වශයෙන් අඩුවීමත් සමඟ, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උප අංශය ද මන්දගාමීව නමුත් අඛණ්ඩව වර්ධනය විය.

සමාගම් කිහිපයක සිදු වූ නව බඳවා ගැනීම් හේතුවෙන් අගෝස්තු මාසයට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ දී සේවා නියුක්තිය ඉහළ ගිය අතර, නිමකිරීමට නියමිත කාර්යයන් වැඩි වේගයකින් පහළ ගියේය.

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | අගෝ. | සැප්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.6** | **54.7** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | <u>**උප-දර්ශක**</u> | | |
| නව ව්‍යාපාර | 62.4 | 55.8 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 58.9 | 53.4 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 50.0 | 51.0 | + | නොවෙනස්ව පැවතීමක සිට ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 47.3 | 41.1 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 69.4 | 72.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් සැප්තැම්බර් මාසයේ දී වැඩි වේගයකින් අඛණ්ඩව ඉහළ ගිය අතර, මේ සඳහා සෘතුමය ඉල්ලුම ඉහළ යෑම පිළිබඳ අපේක්ෂා සහ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමත් සමඟ ආර්ථික ක්‍රියාකාරකම්වල වැඩිදියුණුව පිළිබඳ අපේක්ෂා හේතු විය.

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 සැප්තැම්බර් මාසයේ දී 50.8ක් වාර්තා කළේය.

චීනය, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2023 සැප්තැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළ අතර, එක්සත් රාජධානියේ සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය අනුව එහි සේවා ක්‍රියාකාරකම්වල පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 ඔක්තෝබර් 13වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.